

# ‘පුංචි කුරුළු කූඩුවේ උන් ඉන්නවා යාළුවේ එපා මුගුරු විසිකරන්න නිකන් ඉදින් යාලුවේ’

අමතක කල නොහැකි ගීත ගොන්නකුත් අරගෙන සමන් ද සිල්වා මෙල්බර්න් වලට මාර්තු පලවෙනිදා පැමිණෙන බව අපට ආරංචි වුනා.



**සමන්අයියේ, ලගදී මෙල්බර්න් එනවා කියලා ආරංචියි?**

ඔව්. වසර 6කට පමණ පසු මෙල්බර්-න් වලට මම එනවා. සිඩ්නි, බ්‍රිස්බන් නගර වලත් මේ සංචාරයේදී ප්‍රසංග වලට සහභාගී වෙනවා. බ්‍රිස්බන් වලට මම එන්නේ ප්‍රථම වතාවට. මේ හැම නගරයකම ඉන්න ශ්‍රී ලාංකිකයන්ට හොඳ සංගීතම ය අත්දැකීමක් දෙන්න බලාපොරොත්තු වෙනවා.

**වැඩිම විදෙස් සංචාර ගණනක් සහභාගීවූ ගායකයා ලෙෂ ඔබට විරුදාවලියක් තිබෙනවා.**

ඔව්, මම මේ වෙන කොට සංචාර 215 කට පමණ සහභාගී වෙලා තිබෙනවා. ඒ අතරින් ජපානය සුවිශේෂී තැනක් ගන්නවා. හැම වයස් කාණ්ඩයක්ම කැමති ගීත ගණනාවක් මා සතුවීම ඒකට හේතුවක් වෙන්න පුළුවන්.



**පරම්පරා ගණනක් නටවපු කෙනෙක්.**

මිනිස්සු සතුටු වෙන බිට් එකක් තමා බයිලා වල තියෙන්නේ. ශ්‍රී ලාංකිකයන්ගේ හදවතේ බීට් එක බයිලා. මේ වෙන කොටඅවුරුදු 46ක් පමණකාලයක්මම ගායනක්ෂේත්‍රයේඉන්නවා.. එහෙම බලද්දී.. ඔව්.. 1972 ඉදන්පරම්පරා ගණනක් සතුටින් බයිලා වලින් නටවපු ගායකයෙක්.

**“තණනිල්ල දිගේ ඇදිලා යනවා..සිත මා පිරිලා ..**
**දහසක් නෙතු මා වෙත යොමු වෙනවා .. සිත මා පිරිලා”**
**ඔබේ ඉතාම ප්‍රසිද්ධ ගීතයක්. මේ ගැන මදක් මතක් කලොත්**

ඔව්. මේක ඉතාම ප්‍රචලිත වෙච්ච ගීතයක්. 1982 දී ක්ලැරන්ස් විජේවර්වධන කරපු කැසට් එකකට මට කියන්න තිබ්බ ගීතය තමා මේක. පද රචනය වර්නන් පෙරේරා.අපි මේක *record* කරලා ගෙනිච්චා අස්ගිරිය *ground* එකට. *England vs SriLanka* තරගය තමා තිබ්බේ. එදා ඉදන් අද වෙනකන් ඕනෑම තැනක මගෙන් ඉල්ලන ගීතයක් තමා මේක.

**මාර්තු පලවෙනිදා මෙල්බර්න් ප්‍රසංගය මොන වගේ අත්දැකීමක් වෙයිද?**

මගේ ජනප්‍රියම ගීත එදාට ගායනා කරනවා.. මාත් එක්ක පරම්පරා ගණනාවක් ශ්‍රී ලාංකිකයන් රසවත් කරපු ගායකයෙක් වන නිහාල් නෙල්සන් එකතු වෙනවා . මෙල්බර්න් වල වේග රිද්ම *dance night* වලට ප්‍රසිද්ධ *TANTRA Band* එක තමා අපිට සංගීතය සපයන්නේ. “සංතෝෂවෙන්න . ප්‍රීතිවෙන්න”කැමති මෙල්බර්න් සියලු රසිකයන්ට මාර්තු 1 . *Malvern Town Hall* එකට එන්න කියල ආරාධනා කරනවා.

**නිහාල් අයියේ, මොකද හිතන්නේ මේ *combination* එක ගැන ?**

ප්‍රථමයෙන්, ඕස්ට්‍රේලියාවේ ඉන්න සියලුම ශ්‍රී ලාංකිකයන්ට ආයුබෝවන් කියා කියනවා. සමන් එක්ක මම පසුගිය වර්ෂයේ පර්ත් වල ප්‍රසංගයකට සහභාගී වුනා. ඒ ප්‍රසංගය අති සාර්ථකයි. හැමෝම රස වින්දා. මම හිතන්නේ ඒ ආරංචිය මෙල්බර්න් වලටත් පැතිරිලා තියෙන හින්දා තමා අපි දෙන්නට මේ සංචාරයට ආරාධනය කරන්න ඇත්තේ.



**මෙල්බර්න් වලට ඔබ කාලෙකින් පැමිණෙන්නේ..**

ඔව්, 2014 වර්ෂයේ මම අවසන් වරට මෙල්බර්න් පැමිනියේ. ඉතාමත් සාර්ථක ප්‍රසංගයක් කරන්නට හැකි වුනා. 2019 දීත් සියලුම රසිකයින් සතුටුකරන්න බලාපොරොත්තු වෙනවා. මෙල්බර්න් කියන්නේ ලංකාවෙන් පිට ලංකාව වගේ තැනක්.

**කැසට් පට සීයකින් හොදම ගීත ටික තෝරා ගත්තේ කොහොමද?**

“ලස්සනට පිපුණුවනමල්” මම *record* කලේ 1963 මාර්තු මාසේ. ඒ මීට අවුරුදු 56කට කලින්. “ගුණේ අයියගේ බජව් දාන කාමරේ” තමා මගේ පළවෙනි කැසට් එක. මගේ 110 වෙනි කැසට්එක“ඩොට්කොම්”. “සල්ලිමිටි ගණන”, “කාවඩි බයිලා”, “කුක්කු කූ කූ” මේ වේග රිද්ම ගී රසිකයින් හැමවිට මගෙන් ඉල්ලනවා. ඉතින් බ්‍රිස්බන්, සිඩ්නි ප්‍රසංග සංවිධායකවරුන් සමගත් කතා කරලා මගේ අත් දැකීම් අනුව රසිකයෝ වැඩියෙන්ම කැමති ගීතත් එකතු කරලා තමා මේ සංචාරයට ගීත තෝරා ගත්තේ.

**මෙල්බර්න් රසිකයින්ට, මිතුරන්ට මොකද කියන්න තියෙන්නේ**

අපේ යාලු මිත්‍රයන් , රසිකයින් ඉතා විශාල ගණනක් මෙල්බර්න් ඉන්නවා. මාර්තු 1 වෙනිදා ඒ ඔක්කොටම හමුවෙන්න අරාධනා කරනවා.. මෙල්බර්න් වල සංගීත ප්‍රසංග ඉහල ගුණාත්මක බවකින් ඉදිරිපත් කරන්නේ. කලාවට ලැදි , කලා කරුවන්ට ආදරේ කරන මෙල්බර්න් ලාංකිකයන්ට හොද අත්දැකීමක් ලබා දෙන්න මමත්, සමනුත්, *TANTRA* ත් බලාපොරොත්තු වෙනවා.